# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
## 3 ශ්‍රේණිය - 2020
## මව් බස
## පළමු වාර පාඩම් අභ්‍යාස - 02

මෙම වැඩ පැවරුම සිදු කිරීමට දරුවාට වැඩිහිටි අයෙකුගේ සහාය ලබා දෙන්න.

01. මෙම ඡේදය දරුවාට තෙවරක් සවන්දීමට සලස්වන්න.

තිත් මුවෝ කීප දෙනෙක් ඉදිරියට ආහ. ඔවුන් ගමන් ගත්තේ යාමිතමින් පොළොවට පා තබන්නාක් මෙන් ඉතා නිසල ව ය. අං තට්ටු කීපයක් දරූ ලොකු මුවෙක් වැව ඉවුරේ සිට ගෙන, දෙකන් ඒ මේ අත හරවමින්, උදාර ලීලාවෙන් බලා සිටියේ ය. ඌ රළේ නායකයා වන්නට ඇත. ඌ එසේ සිටිද්දී සෙස්සෝ වැවට බැස දිය බොන්නට වූහ. මුව දෙනක් කුඩා පැටවකුත් සමඟ දියට බැස්සා ය. අනතුරු ව, මෙතෙක් වේලා ගොඩ සිටි මුවා ද වැවට බැස්සේ ය.

**වනගත ළමෝ**
ආචාර්ය දොන් පීටර් පියතුමා

02. ඡේදය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු වාචිකව ලබා ගන්න.

1) මෙම ඡේදයේ සඳහන් වන්නේ කුමන ස්ථානයක් ගැනද?

2) තිත්මුවෝ ගමන් කළේ කෙසේද?

3) වැව් ඉවුරේ සිටගෙන සිටියේ කවුද?

4) අනෙක් මුවන් සිදුකළේ කුමක්ද?

03. පහත සඳහන් වචන ඡේදයෙන් සොයා රවුම් කිරීමට උපදෙස් දෙන්න.

තිත් මුවෝ කීප දෙනෙක් ඉදිරියට ආහ. ඔවුන් ගමන් ගත්තේ යාම්තමින් පොළොවට පා තබන්නාක් මෙන් ඉතා නිසල ව ය. අං තට්ටු කීපයක් දැරූ ලොකු මුවෙක් වැව ඉවුරේ සිට ගෙන, දෙකන් ඒ මේ අත හරවමින්, උදාර ලීලාවෙන් බලා සිටියේ ය. ඌ රළේ නායකයා වන්නට ඇත. ඌ එසේ සිටිද්දී සෙස්සෝ වැවට බැස දිය බොන්නට වූහ. මුව දෙනක් කුඩා පැටවකුත් සමඟ දියට බැස්සා ය. අනතුරු ව, මෙතෙක් වේලා ගොඩ සිටි මුවා ද වැවට බැස්සේ ය.

1. තිත් මුවෝ
2. පොළොවට
3. යාම්තමින්
4. නිසල ව
5. අං තට්ටු
6. ලීලාවෙන්
7. රළේ
8. මුව දෙනක්

04. එම වචන කියවීමට පවසන්න.

05. එම වචන රූලෙන් 3/4 ප්‍රමාණයට බලා ලිවීමට පවසන්න.

06. ඡේදයේ පළමු වාක්‍ය සහයවන්නාත්, දෙවන වාක්‍ය දරුවාත් ආදී වශයෙන් දෙවතාවක්වත් කියවන්න.

07. නිවැරදි වචනය ලියා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. තිත් මුවන් ගමන් ගත්තේ යාන්තමින් ................................ පා තැබීමෙනි.
   ( පොළොවට / වැවට )

2. අං තට්ටු කිහිපයක් දැරූ මුවා ................................... විය.

   ( ලොකු / නායකයා )

3. මුව රළ ............................... බැස දිය බොන්නට වූහ.

   ( ගඟට / වැවට )

4. මුවදෙනක් පැටියා සමඟ ................................... බැස්සා ය.

   ( දියට / පොළොවට )

5. මුවරළ .......................................... ගමන් ගත්හ.

   ( සමඟියෙන් / අසමඟියෙන් )

08. ප්‍රශ්න අංක 03 හි රවුම් කරන ලද වචන අසා ලිවීමට දෙන්න.